(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(8).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා**

## 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 19 දිනැති අංක 1789/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.02.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1554/'11

ගරු රවී කරුණානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විහාරමහා දේවී උද්‍යානය අසල ඉදිකර ඇති චීන සංස්කෘතික මධ්‍යස්ථානය 2002 - 2004 කාල සීමාව තුළදී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ අග්‍රාමාත්‍යධූරය යටතේ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ත්‍යාගයක්ද;

(ii) එය පූර්ණ ප්‍රදානයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ වූ දිනය සහ අවසන් වූ දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ එය අවසන් කිරීමේදී දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය සඳහා වැයවූ පිරිවැය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ සේවයේ යෙදවූ දේශීය සහ විදේශීය සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී ව්‍යාපෘතියේ විදේශික ශ්‍රමිකයන්ට, ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ සමාගම හෝ රට විසින් ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) චීන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1826/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදුකළ වියදම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරඟාවලියේ විකාශන අයිතිය ලබා දී තිබෙන සමාගමේ නම කුමක්ද;

(ii) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුදල් සම්භාරයෙන් හම්බන්තොට ක්‍රීඩාංගණය ගොඩනැගීමට සහ අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2036/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විදේශගතවීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය විසින් වාර්ෂිකව වියදම් කර ඇති මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී, නිලධාරීන් විදේශගත වූ එක් එක් අවස්ථාවේදී වියදම් කළ මුදල;

(iii) එම එක් එක් අවස්ථාවේදී නිලධාරීන් විදේශගත වී සිටි දින ගණන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලධාරීන්ගේ ඉහත සඳහන් විදේශගතවීම් හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ යහපත් හෝ අයහපත් ප්‍රතිඵල කවරේද;

(ii) විදේශගත වූ නිලධාරීන්ගේ ගමන් වියදම්, නවාතැන් ගත් ස්ථාන සඳහා කළ වියදම් සහ අනෙකුත් වියදම් එක් එක් නිලධාරියාට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිලධාරීන්ගේ සංචාර විස්තර සටහන් පත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී නිලධාරීන්ගේ මාසික වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2220/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, නාගරික මහල් නිවාස හා රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන් තම නිවසේ සින්නක්කර අයිතිකරුවන් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ මාස තුනක් ඇතුළත නිම කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැඩපිළිවෙළ ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ තම නිවසේ සින්නක්කර අයිතිය ලැබූ නාගරික මහල් නිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචි ඉහත පරිදි සින්නක්කර නිවාස අයිතිය ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2550/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 මැයි 30 දින කටුනායක ප්‍රදේශයේදී සිදුවූ වෙඩි තැබීමකින් රොෂේන් චානක නැමැති තරුණයෙකු මිය යෑම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සිදු කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තරුණයා මියයෑම පිළිබඳව සෙවීමට පත්කළ මහානාම තිලකරත්න ඒකපුද්ගල කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) මියගිය තරුණයාගේ පවුලට වන්දි මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) මෙම සිදුවීමේදී තුවාල ලැබූ අයට හා දේපල හානි වූ ආයතනවලට වන්දි ලබාදීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2906/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පළාත් සහා යටතේ පාලනය වන පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව පළාත් මට්ටමින්, වෙන්වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2909/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍යවරු නොමැතිකම නිසා රටපුරා ග්‍රාමීය රෝහල් රැසක් වසා ඇති බවත්;

(ii) රෝහල්වල වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින අවස්ථාවක සෞඛ්‍යය අමාත්‍යාංශයේ ඇතැම් නිලයන් සඳහා පශ්චාත් උපාධිධාරී වෛද්‍යවරුන් පත්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට වෛද්‍යවරුන් පත්කර ඇති අමාත්‍යාංශයේ වෛද්‍යමය නොවන තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් පිරිසක් බඳවා නොගැනීමට හේතු කවරේද;

(ii) අමාත්‍යාංශය තුළ වෙනත් නිලතල දරන වෛද්‍යවරුන් පිරිස රෝහල්වල පවතින වෛද්‍ය පුරප්පාඩු සඳහා පත්කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3010/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගාල්ල ව්‍යාපාරිකයන්ගේ වාණිජ ඉඩම් අත්පත් කරගනු ලැබූ බවත්;

(ii) ඒ යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 460 වැනි පරිච්ඡේදයේ 10(1)(අ) වගන්තිය යටතේ නිකුත්කළ අංක ගාකස/මුඅ/3/1/2002/08 හා 2005.10.13 දිනැති නිවේදනය අනුව පවරාගත් ගාල්ල, දංගෙදර, ජිෆ්රියා මාවතේ, අංක 79බී දරන ස්ථානයේ පදිංචි ඒ. එච්. එම්. මොහිදීන් මහතාගේ ව්‍යාපාරික ස්ථානය පිහිටි අංක 215 දරන ඉඩම් කැබැල්ල වෙනුවෙන් වන්දි මුදලක් මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාපාරික ස්ථානය කඩා ඉවත්කොට, පවරාගත් ඉහත සඳහන් ඉඩම වෙනුවෙන් මොහිදීන් මහතාට නොපමාව වන්දි මුදලක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3163/'12

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජයේ සේවකයින් සඳහා සියයට හතරක පොලී පදනම මත රාජ්‍ය බැංකුවලින් ලබා දෙන දේපල ණය මුදල් ලබාදීම මේ වන විට අත්හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, රජයේ සේවකයින් සඳහා එම දේපල ණය නැවත ලබාදීම ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3164/'12

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුගම සාන්ත මේරි මාවත ලෙසින් පෙරදී හැඳින්වූ වත්මන් කුමාර වෙල්ගම මාවතේ, 1991 දී තාවකාලිකව ඉදිකර පසුව 2005.03.30 දිනැති ප්‍රාදේශීය සභා අනුමතිය අනුව ස්ථිරව තනා විදුලි සැපයුම ද ලබාගෙන තිබූ කඩ කාමර 70 ක් හදිසියේම කඩා ඉවත් කර ඇති බවත්;

(ii) එම නිසා පවුල් 70ක සාමාජිකයින් මේ වන විට අසරණව ඇති බවත්;

(iii) නව කඩ කාමර ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් එක් කඩ හිමියෙකුගෙන් රු. 100000.00ක් බැගින් අත්තිකාරම් මුදල් ලබාගෙන ඇති බවත්;

(iv) නව කඩකාමර ඉදිකිරීමට ප්‍රාදේශීය සභාව සතු ඉඩමක පස් පරීක්ෂා කර ඇති නමුත් මෙතෙක් ඒවා ඉදිකර වෙළඳුන්ට ලබා නොදීම නිසා ඔවුන් විරෝධතා ක්‍රියාමාර්ගයන්ට යොමු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කඩකාමර කඩා ඉවත්කිරීමට උපදෙස් දුන් අය කවුරුන්ද;

(ii) නව කඩකාමර ලබාදීමට අයකළ අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) නව කඩකාමර ඉදිනොකිරීමට හේතුව කවරේද;

(iv) කඩ කාමර අහිමිවූ වෙළඳුන්ට නව කඩකාමර ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1886/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ තානායමට අයත් ගොඩනැගිලි කඩා දමා යළි ඉදිකිරීමට මුල්ගල් තබා වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තානායම නැවත ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු මෙම ගොඩනැගිලි කඩා දැමීමට රුහුණු සංචාරක කාර්යාලයට බලය හිමි වූයේ කෙසේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2133/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් වියදම් කළ මුදල සපයා ගත් ආකාරය කවරේද;

(ii) එකී වියදම් සිදු කළ අයිතමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා සිදු කළ වියදම් හේතුවෙන් මෙරටට ප්‍රතිලාභයක් ලැබුනේද;

(ii) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සාමජිකයාගේ නම, තනතුර සහ ඒ සඳහා ඇති සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2191/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත වගකීම් ප්‍රමාණය එක් එක් වරාය අනුව කවරේද;

(ii) වරාය අධිකාරිය විසින් ඇපවීම් සහ බැංකු ඇප ලබාදුන් හෝ ඔවුන් විසින් ලබා නොගත් ණය සඳහා වගකීම භාරගත් අවස්ථා කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එළඹි ගිවිසුම ඉහත (අ)(i)හි දී ඇති වගකීම් සඳහා ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා වරාය අධිකාරියට අයත් හෝ වරාය අධිකාරිය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරියට අයත් ඉඩම් එම ඉඩම්වල ප්‍රමාණයන්ද සමග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වෙන් කර ඇති ඉඩම්වල සිදුකරමින් තිබෙන ක්‍රියාකාරකම් කවරේද;

(iv) වරාය අධිකාරිය විසින් නඩත්තු කිරීම සඳහා මුදල් වියදම් දරන ඉඩම් හෝ ගොඩනැගිලි සහිත ඉඩම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2011 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ශුද්ධ ලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2221/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, වර්ෂ 2015 වනවිට සෑම වතු සේවක පවුලකටම මූලික පහසුකම් සහිත නව නිවසක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට නව නිවාස හිමි වූ වතු සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉදිවෙමින් පවතින වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2910/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බයෝ බවර් ලංකා සමාගම විසින් මීට වර්ෂ තුනකට පෙර ඩෙංගු මදුරු මර්දනය සඳහා නිෂ්පාදනය කළ බැක්ටීරියාව ඒ සඳහා කියුබාවෙන් ගෙන්වන ලද බී.ටී.අයි. බැක්ටීරියාවට වඩා සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇති බවත්;

(ii) එසේ වුවද තවමත් එම බැක්ටීරියාව ඩෙංගු මදුරු මර්දනය සඳහා යොදා ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බී. ටී. අයි. බැක්ටීරියාව සඳහා වැයවන මුදලින් අඩකට වඩා අඩු මුදලකින් සපයා ගත හැකි ඉහත සඳහන් බැක්ටීරියාව නිෂ්පදානය කිරීමට අවශ්‍ය පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) දේශීය නිෂ්පාදනයක් වන එම ප්‍රබල බැක්ටීරියාව ඩෙංගු මර්දනය සඳහා යොදා ගැනීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2013 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා)

3009/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර - මහනුවර ප්‍රධාන මාර්ගයේ පිහිටි පදියතලාව ජුම්මා දේවස්ථානය සඳහා වකුෆ් මණ්ඩලය විසින් අවසන්වරට භාරකරුවන් පත්කරනු ලැබූ දිනය කවරේද;

(ii) එම භාරකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ට ලබාදුන් භාරකාරත්වය අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් මුස්ලිම් පල්ලියට අයත් ව්‍යාපාරික ස්ථාන සඳහා වකුෆ් පනතේ විධිවිධාන අනුව බදුගිවිසුම් නොමැති වීම නිසා එම දේපල එහි පදිංචිකරුවන්ගේ හෝ කළමනාකරුවන්ගේ ආධිපත්‍යයට යටත් දේපල බවට පත්වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) හි සඳහන් තත්ත්වය පිළිබඳව නොපමාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

(ii) එකී මුස්ලිම් පල්ලියට අයත් දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මාර්තු මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1946/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට වර්ෂයක පමණ කාලයක සිට, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන පිහිටා ඇති සුදු කොහු කර්මාන්තශාලාව වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ විශාල ජනතාවකට රැකියා අහිමිව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුවී ඇති බවත්;

(ii) එම සුදු කොහු කර්මාන්තශාලාව ආශ්‍රිත මධ්‍යස්ථානය මගින් රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමුකිරීමේ අරමුණින් පුහුණු පාඨමාලාවක් ද පවත්වාගෙන ගිය බවත්;

(iii) නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන පවා හිමි කරගත් එම ආයතනය වසා දැමීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, නැවතත් මෙම කර්මාන්තශාලාව ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2192/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරයා විසින් සිදුකරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංචාරය කළ රටවල් කවරේද;

(iii) එම සංචාරයන් සම්බන්ධව දක්වා ඇති අරමුණු සපුරා ගැනීමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයා විසින් කැඳවාගෙන යන ලද නිලධාරීන් සංඛ්‍යාව සහ එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාරයන් සඳහා යොදා ගන්නා ලද අරමුදල් මහජන මුදල්ද, නැතිනම් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ප්‍රදානය කරන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2222/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ධීවර නගර හා ගම්මාන ඉලක්ක කර ගෙන නිවාස 30,000 ක් ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 150 ක් වෙන් කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි රුපියල් කෝටි 150 ක මුදලක් වෙන් කළේ කුමන වර්ෂයේ අයවැයෙන්ද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2410/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුව සඳහා දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට ගිය විසඳුමක් ලබාදෙන බවට ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කළ බවට ඉන්දීය විදේශ අමාත්‍යවරයා විසින් මෑතකදී කරන ලද ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එම ජාතික ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එසේ නම්, දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අමතරව ලබාදෙන අනෙකුත් යෝජනා කවරේද;

(iv) ඒ සඳහා රජය නියෝජනය කරන සියලු පක්ෂවල අනුමතිය ලැබී තිබේද;

(v) එම යෝජනා ක්‍රියාත්මක කරන දිනය කවරේද;

(vi) ඉන්දීය විදේශ අමාත්‍යවරයාගේ ඉහත අ(i) හි සඳහන් ප්‍රකාශය අසත්‍ය නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2537/'12

ගරු අනුර දිසානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ විකාශය කිරීමේ අයිතිය රාජ්‍ය රූපවාහිනී නාලිකාවලට අමතරව පෞද්ගලික නාලිකාවලට ලබාදීමේ පදනම කවරේද;

(ii) පසුගියදා පැවති කොමන්වෙල්ත් බැන්ක් (Commonwealth Bank) කුසලාන ක්‍රිකට් තරගාවලිය ලංකාවේ විකාශය කළ රූපවාහිනී නාලිකාව කවරේද;

(iii) එම නාලිකාව ඒ සඳහා තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) ජාත්‍යන්තර ක්‍රීඩා තරග විකාශය කිරීමට සියලුම රූපවාහිනී නාලිකාවලට අවසර ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2777/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.01.01 දින වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදලේ පැවති සම්පූර්ණ වත්කම් ප්‍රමාණය කොපමණද;

(ii) ගොවි විශ්‍රාම වැටුප ගණනය කිරීමේ ප්‍රතිපත්තිය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප නියමිත දිනට, නියමිත පරිදි ගෙවීමට අපොහොසත් වී ඇති තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2911/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඩෙංගු මර්දනය සඳහා පසුගිය වර්ෂයේදී කියුබාවෙන් ආනයනය කළ බී.ටී.අයි. බැක්ටීරියා විශාල ප්‍රමාණයක් මේ වන විටත් භාවිතයට ගෙන නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කියුබාවෙන් ආනයනය කළ බී.ටී.අයි. බැක්ටීරියාවලින් මේ වන විට භාවිතයට නොගෙන ඉතිරිව ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඩෙංගු රෝගය වසංගත තත්ත්වයට පත්වන තෙක් මදුරුවන් මර්දනය සඳහා එම බැක්ටීරියාව ප්‍රයෝජනයට නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3099/'12

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය වන විට උතුරු මැද පළාතේ හඳුනාගෙන ඇති වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2012 දක්වා කාල සීමාව තුළ වකුගඩු රෝගය වැළඳීමෙන් උතුරු මැද පළාතේ මියගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝගයෙන් ජනතාව මුදා ගැනීමට රජය ගෙන ඇති පියවර කවරේද;

(iv) වකුගඩු රෝගය ඇතිවීම සහ කෘෂි රසායනික ද්‍රව්‍ය හා රසායනික පොහොර භාවිතය අතර සම්බන්ධතාවයක් තිබේද;

(v) වකුගඩු රෝගය හා ඒ ප්‍රදේශයේ ජනතාව බීමට ගන්නා ජලය අතර සම්බන්ධතාවයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3142/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර නගරයේ ආරම්භකර ඇති නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරන මාර්ග පුළුල් කිරීම සඳහා සින්නක්කර ඉඩම්වල පිහිටි සැළසුම් අනුමත කර ඉදිකළ ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට කටයුතු කරන බවත්;

(ii) එම කටයුතු පූර්ව දැනුම්දීමකින් තොරව, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා යුධ හමුදාව යොදවා බලහත්කාරයෙන් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මාර්ගය පුළුල් කිරීම සඳහා නීතියට පටහැනිව කඩා බිඳ දමන ලද ගොඩනැගිලිවලට හා අත්පත් කරගෙන ඇති ඉඩම්වලට වන්දි ගෙවීමක් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3167/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, කන්කසන්තුරෙයි පාර, පලාලි පාර, පේදුරුතුඩුව පාර, මහනුවර පාර හා ප්‍රධාන වීදිය යන ඒ ශ්‍රේණියේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2009 මැයි මස 19 වැනි දිනට පසුව ආරම්භ කර ඇතත් මේ දක්වා එම එක් මාර්ගයක හෝ එම කටයුතු අවසන් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණය කටයුතු භාරගත් කොන්ත්‍රාත් සමාගම දේශීය සමාගමක්ද; නොඑසේ නම්, විදේශීය සමාගමක්ද;

(ii) මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදවනු ලබන්නේ විදේශීය ණය ආධාර යටතේ ලබාගන්නා මුදල්ද; නොඑසේ නම්, රාජ්‍ය මුදල්ද;

(iii) ඉහත කී මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භකර වර්ෂ 3ක් ගතවී ඇතත්, මෙතෙක් එම කටයුතු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1947/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, කපුදූව පේෂකර්ම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ එහි උපකරණ මේ වන විට විනාශවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි ඇති සම්පත් යොදාගෙන නැවත එම පුහුණු මධ්‍යස්ථානය යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ස්ථානය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට හෝ වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2195/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවට අදාළව,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) කොටස් මත ලද ආදායම් සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණයන් කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයෙහි සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකු වෙනුවෙන් වැයවන මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සන්සන්දනාත්මකව කොපමණද;

(v) පුනරාවර්තන නොවන වියදම් කොපමණද;

(vi) බදු සහ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2325/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා සේවයේ නියුතු ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුක්ත කර ඇති බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස බඳවා ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) දැනට සේවයේ නියුතු ගුරු සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු සේවයේ 3-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද ගුරු සහායකවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් ගුරුවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වේතනය කොපමණද;

(v) ගුරු සහායකවරුන්ගේ තනතුරු නාමය වෙනස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගුරු සහායකවරුන් ලෙස බඳවා ගත් සියලුදෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ ස්ථිරකර අදාළ ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවීමටත්;

(ii) ගුරු සහායකවරුන් ලෙස බඳවාගත් දිනයේ සිට බලපවත්වන පරිදි ඔවුන් සේවයේ ස්ථිර කිරීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2493/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේ සිට මේ දක්වා පොලිස් කොස්තාපල් ශ්‍රේණියේ සිට පොලිස් පරීක්ෂක ශ්‍රේණිය දක්වා උසස්වීම් ලද නිලධාරීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එකී තනතුර සඳහා උසස්වීම් ලැබීමට සුදුසුකම් සහිතව සිටින පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් ඉහත උසස්වීම් ලබාදීම සඳහා මේ වන විට නිර්දේශ කර ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එකී නිර්දේශයන්ට අනුව ඔවුන්ට උසස්වීම ලබා දෙන දිනය කවරේද;

(v) උසස්වීම් ලැබීමට සුදුසුකම් ඇති නමුත්, ඒ සඳහා නිර්දේශ කර නොමැති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන්ට උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සුදුසුකම් සපුරා ඇති පොලිස් නිලධාරීන්ට උසස්වීම් නොලැබීමේ හේතුව මත ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ අංක 145, 147, 151 හා 152 නඩුවලට අදාළව 2012.01.19 දිනැති තීන්දුව ප්‍රකාරව ඔවුන්ට එකී උසස්වීම් ලබාදීමට කටයුතු යොදන්නේද;

(ii) එසේ නොකරන්නේ නම්, එමගින් අධිකරණයට අපහාස කිරීමක් සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2968/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය මැදිරි කිහිපයක් මේ වන විට පෞද්ගලික සමාගම්වලට පවරා දීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම් අහිමිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම් වෙත පවරාදීම මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම කොපමණද;

(ii) දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම්වලට ලබාදීම තුළින් දුම්රිය සේවය පෞද්ගලීකරණය කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පෞද්ගලික සමාගම්වලට පවරා දී ඇති දුම්රිය මැදිරි නැවත දුම්රිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර දුම්රිය සේවය පෞද්ගලීකරණයවීමට ඉඩ නොදී රැක ගැනීමට කටයුතු කරන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් වාර්ෂිකව විගණනයට භාජනය කළ යුතු යැයිද, ඒවා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට ඍජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවිව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවුවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මූලාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මූලාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර ඇඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපලට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ

පැමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදී සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක්

නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා, —නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම, — පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම

බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ

අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වානිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවි කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවි කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවි කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ

දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 164/’12

ගරු රවී කරුණානායක මහතා,— සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කිරීම,— දේශපාලන මැදිහත්වීම් සහ දේශපාලන අනුග්‍රහයන්ට විශේෂයෙන් සම්බන්ධ සියලුම බාධකයන් ඉවත් වන පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 165/’12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට “කලින් ඡන්ද ප්‍රකාශ කිරීම” හඳුන්වා දීම,— වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා බොහෝ අඩුපාඩු මගහරවා වඩාත් සතුටුදායක තත්ත්වයකට පත්කිරීමට සහය වනු පිණිස, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට “කලින් ඡන්ද ප්‍රකාශ කිරීම” හඳුන්වාදීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 166/’12

ගරු රවී කරුණානායක මහතා,— විවෘත ඡන්ද හිමි නාම ලේඛනයක් හඳුන්වාදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය වර්තමානයෙහි පවත්වාගෙන යන ස්ථාවර ආකාරයේ නාම ලේඛනයක් වෙනුවට විවෘත නාම ලේඛනයක් බවට පත් කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/’12

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි

පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2013 මාර්තු මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1968/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වත්තාවෙල විදුහල් මාවතට නුදුරුව, කිරිදිගහ හරහා ගම්මාන කිහිපයක් සම්බන්ධ කරමින් පාලමක් ඉදිකිරීම සඳහා මැනුම් කටයුතු සිදුකර ඇස්තමේන්තු සැකසුවත් මේ වන තෙක් පාලම ඉදිකර නොමැති බවත්;

(ii) එම ස්ථානයේ පාලමක් නොමැතිවීමෙන් ගම්මාන කිහිපයක ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාලම ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2200/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොලිස් නිලධාරීන් සමග සමාන රාජකාරියේ යෙදෙන පොලිස් ආරක්ෂක සහායකයින්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ ස්ථිර කර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිස් ආරක්ෂක සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබුවේද;

(ii) ඔවුන්ට නිසි නිල ඇඳුමක් සහ රාජකාරියේ යෙදෙන අවස්ථාවල තොරතුරු සටහන් පොතේ රාජකාරි වාර්තා කිරීමේ අවසරය ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක, කලාප දීමනා, ගමන් වියදම්, දුෂ්කර දීමනා, බටා දීමනා සේවය ස්ථිර කළ දින සිටම පොලිස් ආරක්ෂක සහායකයන්ට ගෙවා තිබේද;

(iv) එසේ ගෙවා නොමැති නම්, එම වරප්‍රසාද ඔවුන්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2494/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගායන ශිල්පිනී නන්දා මාලනී මහත්මිය ඇතුළු කණ්ඩායමක් 2012.02.01 දින ක්වේට් රාජ්‍ය වෙත ගමන් කිරීමේ දී එරට ආරක්ෂක අංශවල විශේෂ පරීක්ෂාවට ලක් වී ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එවැනි පරීක්ෂාවකට ලක් කිරීමට හේතු කවරේද;

(iii) එම පරීක්ෂාවේදී සැක කටයුතු කරුණක් හෝ භෝඩුවාවක් ඇය වෙතින් හෝ ඇයගේ කණ්ඩායමෙන් හමුවී තිබේද;

(iv) ඉහත සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය පරීක්ෂණයක් සිදු කර තිබේද;

(v) ඒ සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කරුණු විමසා තිබේද;

(vi) මෙම පරීක්ෂා කිරීම අසත්‍ය තොරතුරු මත සිදුකර ඇත්නම්, එම අසත්‍ය තොරතුරු ලබාදුන් පාර්ශ්වයන් හඳුනාගෙන තිබේද;

(vii) එසේ නම්, ඔවුන්ගේ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නන්දා මාලනී මහත්මියට සිදු වූ අපහසුතාවය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2551/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 පෙබරවාරි 15 දින හලාවත ප්‍රදේශයේදී සිදුවූ වෙඩි තැබීමකින් ඇන්තනී ප්‍රනාන්දු නැමැති ධීවර කාර්මිකයෙකු මිය ගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙඩිතැබීමට අදාළව පොලිස් පරීක්ෂණ සිදු කළේද;

(ii) මියගිය එම ධීවර කාර්මිකයාගේ පවුලට වන්දි මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2969/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාස 7ක කාලය තුළදී, මෙරටේ පාසල් 200කට අධික ප්‍රමාණයක් වසා දමා ඇති බවත්;

(ii) තවත් පාසල් 1590 ක් වැසී යාමේ අවදානමට ලක්ව ඇති බවත්;

(iii) පාසල් වර්ගීකරණය යටතේ නවීන පහසුකම් සහිත පාසල් ඇතිකරන බව රජය පැවසුවද, එවැනි එකදු පාසලක් හෝ දැක ගැනීමට නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජය විසින් වර්ගීකරණය කරන ලද පාසල් කවරේද;

(ii) එම වර්ගීකරණය යටතේ නවීකරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත පාසල් වර්ගීකරණය යටතේදී එක් පාසලකට වෙන් කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නිදහස් අධ්‍යාපනයේ සමාන අයිතිවාසිකම් උපරිම ලෙස දූ දරුවන්ට ලබාදීමට රුකුල් වන රජයේ පාසල් වැසීයාමට ඉඩ නොදී ඒවා නවීකරණය කොට රටේ අනාගත පරපුර උදෙසා ලබාදීමට කටයුතු කරනු ලබන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2987/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රමිතිය සහතික කළ භාණ්ඩයක ප්‍රමිතිය අඛණ්ඩව සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ගන්නා පියවර කවරේද;

(ii) ඊට අදාළ චක්‍රලේඛ, රෙගුලාසි හෝ නියමයන් තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වෙළඳපලේ ඇති S.L.S ප්‍රමිති සහතිකය සහිත ඇස්බැස්ටස් සෙවිලි තහඩු වර්ගයක ප්‍රමිතිය අඩුවීම පිළිබඳ පරීක්ෂණ පවත්වන ලෙස බණ්ඩාරගම ජගත් චන්ද්‍ර පෙරේරා සහ බුද්ධි ජයවික්‍රම පෙරේරා යන අය විසින් 2011.09.23 දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට පැමිණිලිකර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත පැමිණිල්ලට අදාළව පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් සෙවිලි තහඩු සඳහා S.L.S ප්‍රමිතිය පිරිනැමූ දිනය කවරේද;

(iii) එම සෙවිලි තහඩුවල ප්‍රමිතිය අඛණ්ඩව පවත්වාගෙනයෑම සහතික කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත පැමිණිල්ලෙහි සඳහන් සෙවිලි තහඩු නිෂ්පාදන සමාගම විසින් තම නිෂ්පාදනවල S.L.S ප්‍රමිතිය පවත්වාගෙන යන්නේද පිළිබඳව පරීක්ෂා කිරීමට 2011 වර්ෂය තුළ සිදුකළ විද්‍යාත්මක පර්යේෂණයන් කවරේද;

(ii) එම පර්යේෂණ සිදු කළ දින කවරේද;

(iii) ඊට අදාළ වාර්තා ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3101/'12

ගරු පී. හැරිසන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සේවය කරන සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන් ආරක්ෂක අංශයේ රාජකාරිවලට අමතරව වෙනත් රාජකාරි සඳහා යොදවා තිබේද;

(iii) එසේ නම්, එම රාජකාරි කවරේද;

(iv) අමතර රාජකාරිවල යෙදීම සඳහා අතිකාල දීමනා හා වෙනත් දීමනා ලබා දෙන්නේද;

(v) එසේ නම්, එක් නිලධාරියෙකුට ලැබෙන එම දීමනාවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිවිල් ආරක්ෂක නිලධාරීන් කුඹුරු ගොවිතැන, ගඩොල් කැපීම සහ එළවන් හා ඌරන් ඇතිකරන ගොවිපලවල සේවය කිරීම වැනි අමතර රාජකාරීවල යොදවා තිබේද;

(ii) ගඩොල් කර්මාන්තයේ යොදවා ඇති එක් නිලධාරියෙකු සෑම මාසයකම අනිවාර්යයෙන්ම ගඩොල් 2000 ක් සෑදිය යුතු බවට නියෝගයක් පනවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3143/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හතලිස් තුන් ලක්ෂයක් පමණ වන පාසල් සිසුන් අතරින් උසස් අධ්‍යාපනය සඳහා වරම් ලබන ප්‍රතිශතය කොපමණද;

(ii) ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව එම ප්‍රතිශතය අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iii) අධ්‍යාපනය වෙනුවෙන් 2012 හැර පසුගිය වර්ෂ විස්සක කාලය තුළ යෙදවූ මුදල ඒ ඒ වර්ෂවල දළ දේශීය ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 වර්ෂය තුළ අධ්‍යාපනය වෙනුවෙන් රජය වෙන්කළ මුදල දළ දේශීය ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන්ගෙන් මුදල් එකතු කිරීම මේ වනවිට සාමාන්‍යයෙන් පවතින ක්‍රියාවලියක් බවත්;

(ii) එයට හේතුව රජය අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් නොකිරීම බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3168/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයෙහි නල්ලූර්, මානිපායි (වලිකාමම් නිරිතදිග) චුන්නාගම් (වලිකාමම් දකුණ) යන ප්‍රාදේශීය සභා නගර සභා ලෙස උසස් කරන මෙන් ඉල්ලා විධිමත්ව සකස් කළ ඉල්ලුම්පත් අදාළ දෙපාර්තමේන්තු හරහා යොමු කර මාස කිහිපයක් ගතවී ඇතත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් සිදුවී නැති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ඉල්ලීම අනුව ඉහත පළාත් පාලන ආයතන නගර සභා ලෙස උසස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1970/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව මේ වන විට වසා දමා ඇති බවත්;

(ii) වසා දැමූ බෙහෙත් ශාලාවේ ගොඩනැගිලි විනාශවෙමින් පවතින බවත්;

(iii) බෙහෙත් ශාලාව වසා දැමීම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බෙහෙත් ශාලාවේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, රොටුඹ මධ්‍යම බෙහෙත් ශාලාව සඳහා කඩිනමින් වෛද්‍යවරයකු පත් කර ප්‍රදේශයේ ජනතාවට සහන සැලසීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2201/'11

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය තුළ මෙම අමාත්‍යාංශය විසින් කලුතර දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2012, 2013 සහ 2014 යන වර්ෂවලදී ඉදිකිරීමට අපේක්ෂා කෙරෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් නිවාස ඉදිකිරීම සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම අලුතින් ඉදිකරනු ලැබූ නිවාස නොමිලේ ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, එම නිවාස අලෙවි කරනු හෝ කුලියට දෙනු ලබන්නේ කවර මිලකටද;

(iii) එම නිවාස ලබා දෙන පදනම කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2330/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවාවට සහයවීම සඳහා 2006.08.02 දින අංක 16/1395/206/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇති බවත්;

(ii) යුදමය වාතාවරණයක් පැවති අවස්ථාවේදී, ජාතික වැදගත්කමක් ඇති උත්සවවලදී සහ විවිධ ආපදා අවස්ථාවන්හිදී සිවිල් ආරක්ෂක නිලධාරීන් පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇති බවත්;

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2009.12.15 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයෙහි 2009.10.31 වැනි දිනට අඛණ්ඩව දින 180ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ සේවය කඩිනමින් ස්ථිර කරන බවට සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට සිවිල් ආරක්ෂක සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම සේවයේ විවිධ ක්ෂේත්‍රවල සේවය කරන එක් එක් නිලධාරීන්ට දැනට ගෙවනු ලබන දෛනික වැටුප කොපමණද;

(iii) දෛනික වැටුපට සේවය කරන ඉහත දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සේවය ස්ථිර කර, ස්ථිර වැටුප් තලයක පිහිටුවා රජයේ නිලධාරීන්ට හිමි සියලුම වරප්‍රසාද ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2495/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල හා මාවතගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් හඳුරුක්කන්ද නමති කන්දේ හෝ එයට ආසන්නව වෙනත් කන්දක පිහිටි කලුගලක් කඩා දමමින් ගල් කොරියක් පවත්වාගෙන යන්නේද;

(ii) ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමතිය ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

(iv) එම ගල්කොරිය පවත්වාගෙන යන අය කවුරුන්ද;

(v) එම ගල්කොරියේ හිමිකාරිත්වය ඇත්තේ ආයතනයකට නම්, එහි නම, ලිපිනය සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vi) එම ගල පිහිටි ඉඩමේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් පුද්ගලයාට අයත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එම ගල කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කලුගල් කොරිය පිහිටි කඳුවැටියෙන් පෝෂණය වන වැව් පිහිටා තිබේද;

(ii) එම කඳුවැටිය ආශ්‍රිතව සිදුකරන කලුගල් කැඩීම හේතුවෙන් සිදුවන පරිසරය විනාශය නිසා ඒ යටතේ පෝෂණය වන වැව්වල ජල මූලාශ්‍රවලට, ජීවීන්ට සහ ස්වභාවික භූමියට සිදුවන හානිය සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2970/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට පෞද්ගලික රෝහල්වල බොහෝ විදේශ ජාතික වෛද්‍යවරුන් සේවය කරන බවත්;

(ii) එම වෛද්‍යවරුන්ගෙන් බහුතරයක් නිසි සුදුසුකම් සපුරා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙරට පෞද්ගලික රෝහල්වල සේවය කරන විදේශීය වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෛද්‍යවරුන් අතරින් නිසි සුදුසුකම් සපුරා නොමැති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙරට සේවය කරනු ලබන විදේශීය වෛද්‍යවරුන්ට ලියාපදිංචිය ලබාදීමේදී ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iv) මේ වනවිට ලියාපදිංචිය ලබා ඇති සුදුසුකම් සපුරා නොමැති විදේශීය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අහෝසි කොට ඔවුන් අතින් අසරණ රෝගීන් ජීවිතාවදානමට ලක්වීම මඟ හැරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මාර්තු මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1971/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කලාපයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල දැඩි සේ අබලන් වී ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල මාර/ඌරුබොක්ක ජාතික පාසල් භූමියෙහි ම පිහිටා ඇති බැවින්, එම විද්‍යාලයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ මෙන්ම එහි සේවකයින්ගේ ජීවිතවලටද දැඩි තර්ජනයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2202/'11

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් සහ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් සිදු කරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ සංචාරය කරන ලද රටවල් කවරේද;

(iii) මෙම සංචාර සම්බන්ධයෙන් සඳහන් අරමුණ ඉටුකර ගැනීමට තිබූ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් සංචාරය සඳහා අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය අමාත්‍යතුමා කැටුව ගිය නිලධාරීන් සංඛ්‍යාව සහ එම එක් එක් සංචාරය සඳහා වැයවූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාර සඳහා වියදම් කරන ලද මුදල් රජයේ මුදල්ද, එසේ නැතහොත් ඉහත සඳහන් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ලබාදෙන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2428/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවාවට බඳවා ගැනීමේ වැඩපිළිවෙළක් 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ යටතේ උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම ක්‍රියාපටිපාටිය රැකියා විරහිත සෑම උපාධිධාරියකුටම සාධාරණය ඉටු වන සේ ක්‍රියාත්මක වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2496/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ රජයේ රෝහල්වලට මෙට්ට සැපයූ ආයතන කවරේද;

(ii) එම ආයතන තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම කාල සීමාව තුළ ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

(iv) 2011 වර්ෂයේදී හෝ 2012 වර්ෂයේ මුල් කාලයේදී හලාවත දිස්ත්‍රික් මහ රෝහලට මෙට්ට සැපයූ ආයතනයේ හිමිකරුගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) එම ආයතනය සැපයූ මෙට්ට සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම කොපමණද;

(vi) එම මෙට්ට තොගය රෝහලට ලැබුණු දිනය කවරේද;

(vii) එම මෙට්ට මිලදී ගැනීම අනුමත කළ නිලධාරියාගේ හෝ නිලධාරින්ගේ නම් සහ තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මෙට්ට තොගය වෙනුවෙන් ලබාදුන් ප්‍රමිති සහතිකය ඉදිරිපත් කරන්නේද;

(ii) එම මෙට්ට භාවිත කළ හැකි අවම කාල සීමාව කොපමණද;

(iii) ඒවා මේ වන විට භාවිතා කරනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(v) ඉහත මෙට්ට සැපයූ ආයතනය වෙනත් රෝහල්වලටද මෙට්ට ලබා දී තිබේ නම්, එම එක් එක් රෝහලට ලබා දී ඇති මෙට්ට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

2973/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හෘද ශල්‍යකර්ම සිදු කිරීමට අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ හා ඖෂධ නොමැතිවීම සහ 2008 වර්ෂයේදී ඉදිකළ හෘද ඒකකයේ ශල්‍යාගාරය මේ වනතුරුත් ස්ථාපිත නොකිරීම යන හේතු නිසාවෙන් කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද රෝග ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් එම රෝහලින් ඉවත්ව ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඉදිකළ හෘද ඒකකයේ ශල්‍යාගාරය විවෘත කරන දිනය කවරේද;

(ii) එම රෝහලේ හෘද ශල්‍යකර්ම සිදු කිරීම සඳහා හිඟ වී ඇති වෛද්‍ය උපකරණ හා ඖෂධ පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) හෘද ශල්‍යකර්ම සිදු කරනු ලබන සියලුම රෝහල්වල පවතින අඩුපාඩු සොයා බලා, අදාළ ඖෂධ හා උපකරණ ලබාදී අසරණ හෘද රෝගීන්ගේ ජීවිත බේරාගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3169/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා සංවර්ධන ව්‍යාපෘතිය (NELSIP) මගින් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ එක් එක් පළාත් පාලන ආයතනය විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඇතැම් යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් විසින් වෙනස් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, වෙනස්කර ඇති එම යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1973/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි මුලටියන ප්‍රජා ජල පිරිපහදු මධ්‍යස්ථානයේ යන්ත්‍රාගාරයට විදුලිබලය නොමැතිවීම නිසා එම ප්‍රදේශයේ ජනතාව පිරිසිදු පානීය ජලය ලබාගැනීමට නොහැකිවීමෙන් බරපතල ගැටලු රාශියකට මුහුණපා ඇති බවත්;

(ii) ඒ සඳහා අරමුදල් සැපයීමට අදාළ බලධාරීන් පොරොන්දු වුවත්, මේ දක්වා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජල පවිත්‍රාගාරය සඳහා කඩිනමින් විදුලිය ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2203/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු නොලබන, පසුගිය වර්ෂ දහය තුළදී පිහිටුවනු ලැබූ, රජයට අයත් සියලුම සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සඳහන් සමාගම් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, එම සමාගම් අධීක්ෂණය කරනු ලබන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දහයක කාලය තුළ,

(i) රජය විසින් කිසියම් බද්දක් අයකර ගෙන ඇති හෝ රජය වෙත ලාභාංශ ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) රජය විසින් මුදල් ගෙවන ලද, එහෙත් රජය වෙත කිසිදු මුදලක් ආපසු ලබාදී නොමැති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය වෙත රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන සමස්තයක් ලෙස, එක් එක් වර්ෂය සඳහා ලාභයක් හෝ අලාභයක් ලැබුවේද;

(v) එම එක් එක් ආයතනයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කවරේද; සහ

(vi) රජය විසින් එම එක් එක් ආයතනය සඳහා යොදවන ලද සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය කවරේද;

යන්නත් ඉහත (අ)(i) හි සඳහන් කළ සමාගම්වලට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2430/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ නියැලෙන සියලුම ධීවර ප්‍රජාවට ජීවන වියදම් සහනාධාරයක් හෝ ඉන්ධන සහනාධාරයක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එක් ධීවරයෙකුට ලබාදීමට බලාපොරොත්තු වන සහනාධාර මුදල කොපමණද;

(iv) එම මුදල ගණනය කිරීමට යොදා ගන්නා නිර්නායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2497/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සහල් පිටි උපයෝගී කර ගනිමින් පාන්, බනිස් ඇතුළු බේකරි නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා වර්ෂ 2005 සිට 2012 දක්වා කාලය තුළ රජය වෙන් කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණ ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම නිෂ්පාදන කටයුතු සඳහා මිල දී ගෙන ඇති යන්ත්‍ර සූත්‍ර කවරේද;

(ii) එම යන්ත්‍ර සූත්‍රවල වටිනාකම් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවා ලබා දී ඇති පුද්ගලයින් හෝ ආයතන කවරේද;

(iv) මේ වන විට එම යන්ත්‍රසූත්‍රවල තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ලබා ඇති වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) තිරිඟු පිටි බේකරි නිෂ්පාදන වෙනුවට සහල් පිටි බේකරි නිෂ්පාදන රට තුළ පූර්ණ වශයෙන් භාවිතය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සකසා තිබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2974/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ 2012 අගෝස්තු මාසයේ දින තුනකදී ආහාර සැපයීම පිළිබඳ අර්බුදයක් නිර්මාණය වී තිබූ බවත්;

(ii) ආහාර සැපයීමේ ටෙන්ඩරය විධිමත් ආකාරයෙන් ලබා නොදීම ඊට හේතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2012 ජුලි 01 දින සිට අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ ආහාර සැපයීම සඳහා ලබා දුන් ටෙන්ඩරය අහෝසි කිරීමට හේතු කවරේද;

(ii) ආහාර සැපයීමේ ටෙන්ඩරය ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) අම්බලන්ගොඩ දිසා රෝහලේ ඇතිවූ එම ගැටලුව පිළිබඳ සොයා බලා නැවත එවැනි තත්ත්වයක් මතු නොවන ආකාරයට විධිමත්ව කටයුතු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ ඇයි?

1974/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ දී උපාධිධාරීන් සඳහා පත්වීම් ලබාදීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ අධි සේවක පදනම මත රාජ්‍ය ආයතන සහ රජයේ පාසල්වල මූල්‍ය සහකාර, සංවර්ධන සහකාර හා කළමනාකරණ සහකාර ලෙස පත්වීම් ලබාදුන් බවත්;

(ii) ඔවුන් සඳහා මේ දක්වා උසස්වීම් ක්‍රමවේදයක් සකසා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ඉහත පත්වීම්ලාභීන්ට එම පාසල්වල හෝ වෙනත් පාසල්වල ගුරු පත්වීම් ලබාගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පත්වීම්ලාභීන් සඳහා උසස්වීම් ක්‍රමවේදයක් සකස් කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2205/'11

ගරු රවී කරුණානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රාජ්‍ය දැව සංස්ථාවට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කොපමණද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස රාජ්‍ය දැව සංස්ථාවට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2433/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආර්ථික වර්ධන වේගයන් සෑහීමකට පත් විය හැකි මට්ටමක පැවතියේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2498/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගොවීන්ගෙන් වී මිල දී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම වී තොගවලින් සහල් නිෂ්පාදනය සඳහා යොදා ගත් වී ප්‍රමාණය කොපමණද;

(iii) එකී කාල සීමාවේ දී කෘමි හානි හෝ නොසැලකිලිමත්කම යන කාරණා හේතුවෙන් වී අලෙවි මණ්ඩලයේ ගබඩා තුළදී විනාශයට පත්වූ වී ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වී අලෙවි මණ්ඩලය මිලට ගැනීමෙන් පසුව කෘමි හානි හෝ අනෙකුත් හේතූන් මත විනාශයට පත් වූ වී තොග සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1975/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතු භාරදී ඇති සමාගම සහ එය අයත් රටේ නම කවරේද;

(ii) තෙල් ළිං කැනීමේ ගිවිසුමේ අඩංගු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම් ද්‍රෝණියේ තෙල් ළිං කැණීමේ දී එහි කිසිදු කටයුත්තක් අධීක්ෂණය කිරීමට සහ ඊට අදාළ තීරණවලට එළඹීමට ශ්‍රී ලංකා රජයට නොහැකි වී ඇති බවත්;

(ii) මේ තත්ත්වය යටතේ තෙල් ළිං කැනීමට අදාළ ගිවිසුමෙහි විනිවිදභාවය පිළිබඳ ගැටලු මතුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2206/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට සිටින කැබිනට් අමාත්‍යවරු සංඛ්‍යාව සහ එම අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශවලට 2012 අයවැයෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත සඳහන් ප්‍රතිපාදන දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) එම අමාත්‍යාංශවල සේවය කරන සමස්ත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එක් අමාත්‍යාංශයක් වෙනුවෙන් මසකට දරන මුළු වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අමාත්‍යාංශ අතරින් කිසියම් අමාත්‍යාංශ සංඛ්‍යාවක් අහෝසි කිරීම හෝ අඩු කිරීම සිදු කළ හැකිද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2437/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරනු ලබන වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ,

(i) සංඛ්‍යාව කොපමණද;

(ii) නම් හා වත්මන් සේවා ස්ථාන කවරේද;

(iii) පත්වීම් සිදු කිරීමට පෙර ඒ සඳහා අයදුම්පත් කැඳවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වැඩබලන අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම් ලද අයගේ,

(i) පෙර සේවා ස්ථාන කවරේද;

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පන්ති හා ශ්‍රේණි කවරේද;

(iii) වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම් කවරේද;

(iv) පත්වීම් සිදු කරන ලද්දේ කවරකු විසින්ද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව පරිදි අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරන නිලධාරීන් පත් කිරීමට නොහැකි බවත්;

(ii) එම සේවයේ තනතුරු සඳහා වැඩබැලීමේ පත්වීම් ලබා දීමට හැක්කේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පමණක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ වනවිට ඉහත සේවයේ ඇති නිත්‍ය තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා සේවා ව්‍යවස්ථාව අනුව ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවා, සුදුසු නිලධාරීන් බඳවා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2499/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන හිටපු අමාත්‍ය ගරු පී. දයාරත්න මැතිතුමා විසින් හිඟුරාණ සීනි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු 2011 වර්ෂයේ දී ආරම්භ කරන බවට 2010 ඔක්තෝබර් 7 වැනි දින පාර්ලිමේන්තුවේදී කර ඇති ප්‍රකාශය පරිදි ක්‍රියාකර තිබේ නම්, මේ වන විට දිනකට එම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන සීනි ප්‍රමාණය කොපමණද;

(ii) සීනි නිෂ්පාදනය ආරම්භ කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාවේ සේවය කරන (වගා අංශයේ හා කර්මාන්ත ශාලාවේ) මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවක සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ගේ වැටුප්, දීමනා, අර්ථසාධක ආදිය නිසි පරිදි ගෙවීමට කටයුතු යොදා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

2975/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අධ්‍යාපන බලධාරීන් වගකීමකින් තොරව ක්‍රියා කිරීම හේතුවෙන් මාතර අධ්‍යාපන කලාපයේ 2012 දෙවැනි පාසල් වාර පරීක්ෂණය සඳහා 2009 වර්ෂයේදී ලබාදුන් විභාග ප්‍රශ්න පත්‍රයක් නැවතත් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙවැනි ගැටලු සහගත තත්ත්වයන් ඇතිවීමට හේතු කවරේද;

(ii) එවැනි තත්ත්වයන්ට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3170/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— නැවත පදිංචිකිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැවත පදිංචි කරනු ලබන සෑම පුද්ගලයෙකුටම රු. 5,000/=, රු.20,000/=, රු. 25,000/= වශයෙන් වූ වාරිකවලින් රු. 50,000/= ක මුදලක් ගෙවනු ලබන බවට අවස්ථා ගණනාවකදීම පොරොන්දු වී ඇති බවත්;

(ii) එම දීමනාව ලබා දෙන බවට බොහෝ අයගෙන් විස්තර සහ අත්සන් ලබාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි නැවත පදිංචි වූ සියලුම පුද්ගලයින්ට රු. 50,000/= ක මුදල මුළුමනින් ලබාදී තිබේද;

(ii) නොඑසේ නම්, දුක්විඳින එම ජනතාවට එම මුදල ලබා දීම සඳහා අඛණ්ඩ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1976/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නෑබඩ, කැන්දකඩුව ග්‍රාමීය රෝහලෙහි පවතින භෞතික හා මානව සම්පත්වල ඌනතාවයන් නිසා එය වැසීයාමේ අවදානමකට මුහුණපා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි පවත්නා අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර ප්‍රදේශයේ ජනතාවට යහපත් සෞඛ්‍ය සේවාවක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එලෙස වෙන්කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2208/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව, එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කවරේද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුනේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2438/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ ප්‍රධාන මාතෘ රෝහලක් වන ගාල්ල මහමෝදර ශික්ෂණ රෝහලට එක් මසකදී ඇතුළු වන ගැබිනි මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහලේ ප්‍රසූතිකාගාර ජීවානුහරණයට ලක්කර කරන්නේද;

(iii) 2012 ජනවාරි සිට මාර්තු දක්වා කාලසීමාවේදී එම රෝහලේ නොමේරු ළදරු ඒකකයේ සිදුවූ ළදරු මරණ සංඛ්‍යාව කොපමණද;

(iv) එම ළදරු මරණවලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහමෝදර රෝහලේ නොමේරු ළදරු ඒකකයේ ප්‍රතිකාර ලබන ළදරුවන්ට ප්‍රමාණවත් ජීවිත සුරක්ෂිතභාවයක් ලැබෙන බව සහ එහි කාර්ය මණ්ඩලය වගකීමෙන් තම සේවය ඉටු කරන බව එතුමා සහතික කරන්නෙහිද?

(ඇ) (i) රෝහලේ පැවති අඩුපාඩු හේතුවෙන් ළදරුවන් මියයෑම වැනි අභාග්‍යසම්පන්න සිදුවීම් ඇති නොවීම සඳහා එම රෝහලේ තත්ත්වය වැඩිදියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2500/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ පුද්ගලික ආයෝජකයන්ට පැවරීම සඳහා 2011 වර්ෂයේ මාර්තු මාසයේදී යෝජනා / ඉල්ලුම්පත් කැඳවා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කන්තලේ සීනි කර්මාන්තශාලාව මේ වන විට පුද්ගලික ආයෝජකයෙකුට පවරා තිබේද;

(ii) එසේ නම්, එම පැවරීම සිදුකළ දිනය හා පැවරූ ආයතනය, සමාගම හෝ ආයෝජකයා කවරේද;

(iii) එම පැවරීම සිදුකළ මිල ගණන කොපමණද;

(iv) එම කර්මාන්තශාලාව පැවරීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වන විට එම කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(ii) අපේක්ෂිත දෛනික නිෂ්පාදන ධාරිතාවය කොපමණද;

(iii) දැනට නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1977/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, පුෂ්පදාන මාවතේ පිහිටුවා ඇති කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව වසා දැමීමේ සැලසුමක් තිබේද;

(ii) වසා දැමීමෙන් පසු එහි ගොඩනැගිලි අසළ පිහිටි කාන්තා විද්‍යාලයක නේවාසිකාගාරයට ලබාදීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හි පරිදි කඳුරට සේවය ගුවන් විදුලි නාලිකාව වැසීමට කටයුතු කිරීම රජය විසින්, රාජ්‍ය ආයතන වසා නොදමන බවට දුන් පොරොන්දුව කඩ කිරීමක් බව පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2241/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 සහ 2011 වර්ෂ සඳහා,

(i) රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම එක් එක් ගොඩනැගිල්ලෙහි වර්ග අඩියක් සඳහා කුලිය සහ බදු හෝ කුලී කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබා ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) එකී බාහිරින් ලබාගත් සේවාවන් සඳහා දරන ලද වියදම කොපමණද;

(vii) අමාත්‍යාංශයේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(viii) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනම මත ගිවිසුම්වලට එළැඹ සේවය සපයන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2504/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන ජනකපුර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනකපුර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2516/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා රේගුව විසින් තාවකාලිකව හෝ ස්ථිරව නිදහස් කිරීම තහනම් කරන ලද ආනයනික පලිබෝධ නාශක බහාලු සංඛ්‍යාව කොපමණද;

(ii) එවැනි තහනම් කිරීම් සිදුකළ එක් එක් අවස්ථාවේදී ඒ සඳහා හේතුවූ කරුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නිදහස් කිරීම තහනම් කරන ලද එම පලිබෝධනාශක බහාලු ආනයනය කරන ලද සමාගම් කවරේද;

(iv) එසේ ගෙන්වනලද බහාලු 14ක් (containers) නිසි පරීක්ෂාවකින් තොරව රේගුව මගින් මෑතකාලයේ නිදහස් කර තිබේද;

(v) එසේ නම්, එම බහාලු නිදහස් කිරීමට අනුමතිය දුන් බලධරයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2977/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පරිපාලනය විසින් සිදුකර ඇති මුදල් වංචා පිළිබඳව අදාළ නිලධාරීන් විසින් වගකිවයුතු බලධාරීන්ට ලිඛිත සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කළද මේ වන තෙක් ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පරිපාලනය විසින් මේ වන විට වංචා කර ඇති මුදල් ප්‍රමාණය සහ එසේ සිදු කළ අවස්ථා ගණන පිළිබඳ නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) අදාළ බලධාරීන් විසින් මූල්‍ය වංචාවන්ට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් මේ වන තෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වංචනික නිලධාරීන්ට මහජනතාවගේ මුදල් ගසා කෑමට ඉඩ නොදී, ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මාර්තු මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2243/'12

ගරු රවී කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කවරේද;

(ii) එක් එක් ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය සහ කුලී හෝ බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබාගැනීම සඳහා වැයකළ මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(vii) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(viii) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනම යටතේ ගිවිසුම්වලට එළැඹ සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2266/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොටවිල, කඹුරුගමුව ලිපිනයේ පදිංචි කේ.කේ. ඇඩ්වින් මහතා,

(i) ලංකා ගමනා ගමන මණ්ඩලයේ (ලංගම) ස්ථිර පුහුණු රියදුරෙකු ලෙස වර්ෂ 1965 සිට 1986 දක්වා සේවය කර ඇති බවත්;

(ii) විශ්‍රාම යෑමෙන් පසුවද වර්ෂ 1986 සිට 1994 දක්වා කොන්ත්‍රාත් පදනම මත රියැදුරෙකු ලෙස නැවත සේවයේ යොදවා ඇති බවත්;

(iii) මේ වනතෙක් ඔහුගේ සේවා කාලය අනුව ඔහුට හිමි අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, පාරිතෝෂිත මුදල් හා වෙනත් කිසිම ගෙවීමක් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් ඇඩ්වින් මහතාට ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, පාරිතෝෂිත මුදල් හා අනෙකුත් ගෙවීම්වල වටිනාකම කොපමණද;

(ii) එම මුදල ශාරීරික වශයෙන් දුර්වලව සිටින ඇඩ්වින් මහතාට ගෙවීමට සහ වර්ෂ විස්සකට අධික කාලයක් ලංගමයෙහි රඳවාගත් එම මුදල වෙනුවෙන් පොලී මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2505/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, පිහිටා තිබෙන සම්පත්නුවර විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්පත්නුවර විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩු පාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2634/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වූ ටෙස්ට් ක්‍රිකට් තරඟාවලියට ඇතුළත් වූ තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ පැවත්වූ ක්‍රීඩාංගන කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරයේ ඇති ආසන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ක්‍රීඩාංගනවල ප්‍රේක්ෂකාගාරයන්හි ආසන සඳහා අය කරනු ලැබූ ගාස්තු කවරේද;

(v) මෙම තරඟමාලාව නැරඹීම සඳහා අලෙවි කළ එක් ටිකට්පතක මිල කොපමණද;

(vi) එම ටිකට්පත වලංගු වූ කාල සීමාව කවරේද;

(vii) ඉහත ක්‍රීඩාංගනවල එක් ප්‍රේක්ෂක ආසනයක් සඳහා රු.5000.00ක අවම මුදලක් අයකර තිබේද;

(viii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2978/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවා වර්ෂ 10ක් ගතවී ඇතත්, මේ වනතෙක් එම ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බවත්;

(ii) එම අධිකාරියේ වගකිව යුතු බලධාරීන් විසින් රාජ්‍ය මුදල් අවිධිමත් ලෙස හා අපරීක්ෂාකාරී ලෙස වැය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 10ක් පුරා සිවිල් ගුවන් සේවා අධිකාරිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා ගෙවා ඇති කුලී මුදල කොපමණද;

(ii) බිම් කුලිය ලෙස විශාල බදු මුදලක් ගෙවන එම අධිකාරිය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) එම ආයතනයේ මුදල් අපරීක්ෂාකාරී ලෙස පරිහරණය කළ බලධාරියාට එරෙහිව යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3171/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝණය වන්නේ නම්, එයට එරෙහිව දැඩි පියවර ගන්නා බවට කළ තම ප්‍රකාශය අනුව කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන්ට සිංහල භාෂාවෙන් පමණක් යොමු කෙරෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවාවේ උසස්වීම් පිළිබඳ සියලුම ලිපි ලේඛනවල දෙමළ පිටපත් ද අදාළ පාසල්වලට ලැබීම සහතික කරලීමටත්;

(ii) සේවක අර්ථසාධක අරමුදල විසින් තමන්ගේ ප්‍රතිලාභීන්ගෙන් දෙමළ මාධ්‍යයෙන් ලැබෙන ඉල්ලීම් ලිපිවලට සිංහල භාෂාවෙන් පමණක් පිළිතුරු යැවීම වෙනුවට දෙමළ මාධ්‍යයෙන්ම පිළිතුරු ලබාදීම සඳහා අදාළ ආයතන යොමු කරවීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2245/'12

ගරු රවී කරුණානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ලෝක උරුම ස්ථානයන් කවරේද;

(ii) එවැනි දර්ශනීය ස්ථානයන් මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, දේශීය ලෝක උරුම ස්ථානයන් නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, එම ස්ථානවලින් උපයා ගන්නා ලද ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සහ 2011 වර්ෂයන්හිදී ඉහත කී ස්ථානයන්හි සෘජු හා වක්‍ර ලෙස සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2439/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී වගා කිරීමට හෝ වෙනත් භෝග වර්ගයන් වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2506/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන කිරි ඉබ්බන්වැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිරිඉබ්බන්වැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2635/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය තුළ දී මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ලබා දී ඇති නව මාර්ග බලපත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත් ලබා දී ඇති මාර්ග කවරේද;

(iii) 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියට අදාළව එකී බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එම බලපත්‍ර අනුමත කළ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

(v) එම අනුමතිය ලබාදුන් අයගේ අත්සන් සහිත ලේඛන ඉදිරිපත් කරන්නේද;

(vi) එකී බලපත්‍ර ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට අයත් මාර්ග කවරේද;

(ii) 2011 වර්ෂයේදී මධ්‍යම පළාතේ එක් එක් මාර්ගය සඳහා අනුමත බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත වර්ෂයේදී එම එක් එක් මාර්ගයේ පැවති බස්රථ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2979/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ 2000ක පමණ පිරිසකට රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා නොදීමටත්;

(ii) ප්‍රාචීන භාෂෝපකාර විභාගය සමත් ඩිප්ලෝමාධාරීන් සඳහා වැඩසටහන් නිලධාරී තනතුරු ලබා නොදීමටත්;

රජය තීරණය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව සහ ප්‍රාචීන භාෂෝපකාර විභාගය අවසන් කර රැකියා අපේක්ෂාවෙන් සිටින සංඛ්‍යාව කොපමණද;

(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ට රජයේ ස්ථිර පත්වීම් ලබා නොදීමට තීරණය කිරීමට හේතු කවරේද;

(iii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ට රජයේ පත්වීම් සහ ප්‍රාචීන භාෂෝපාකාර සමත්වූවන්ට වැඩසටහන් නිලධාරී තනතුරු ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2314/'12

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වනවිට,

(i) මෙරට සේවකයන් විසින් හිමිකාරීත්වය දරනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ (EPF) මුළු වටිනාකම කොපමණද;

(ii) සේවක අර්ථසාධක අරමුදල විසින් මුදල් ආයෝජනය කර ඇති ආයතනවල නම් කවරේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවන සාමාජික සංඛ්‍යාව කොපමණද;

(v) එසේ දායක මුදල් නොගෙවන සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ගෙන් මුදල් එකතු කර නොගැනීමට හේතු කවරේද;

(vi) සාමාජිකයින්ගේ එකතු කරගෙන නොමැති මුදල් ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2446/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර-කොළඹ අධිවේගී මාර්ගයේ නූපෙ සිට මාතර/ගොඩගම දක්වා මාර්ගය පුළුල් කිරීමේදී ඉඩම් පවරා ගැනීම හේතුවෙන් ඇතැම් ඉඩම් හිමියන්ගේ ඉඩම් කොටස් පර්චස් හයකට වඩා අඩුවී ඇති බවත්;

(ii) එවැනි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා මාතර නගර සභාව අවසර නොදෙන බවත්;

(iii) එසේ වුවද, මාතර බෝධිය අසල සිට නූපේ දක්වා ධර්මපාල මාවත පුළුල් කිරීමේදී ඉතිරි වූ ඉඩම්වල පර්චස් හයක අවම සීමාව නොසළකා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සීමා ලකුණු කළ ස්ථානයේ සිට ගොඩනැගිලි ඉදිකිරීමට එම නගර සභාව විසින් අවසර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එකම නගර සභා බලප්‍රදේශයක් තුළ ඉහත පරිදි ක්‍රමවේදයන් දෙකක් ක්‍රියාත්මක කිරීම නිසා එක් ප්‍රදේශයක ජනතාවට විශාල අසාධාරණයක් සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත අ(iii) හි සඳහන් ලිහිල් කොන්දේසි යටතේම නූපේ - ගොඩගම මාර්ගය දෙපස කුඩා ඉඩම්වල ද ඉදිකිරීම් සඳහා අවසර ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2507/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන ඇතාවැටුනවැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇතාවැටුනවැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2636/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය තුළ දී මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියට බඳවාගෙන ඇති නව සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින්ගේ තනතුරු, බඳවාගත් දිනයන් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බඳවා ගැනීම් පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා සිදුකර තිබේද;

(iv) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අනෙකුත් අයදුම්කරුවන්ගේ තොරතුරු කවරේද;

(v) ඉහත බඳවා ගැනීම් සිදු කිරීමේදී පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කර නොමැති නම්, එයට හේතු කවරේද;

(vi) එම නව බඳවා ගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(vii) එසේ නම්, ඊට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?